# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,265 - 2022 ජනවාරි මස 28 වැනි සිකුරාදා - 2022.01.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 240 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 242 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 243 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* කම්කරු වන්දි (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 පෙබරවාරි මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


239 B 820311— 403 (2022/01)
A 1-

# ජනාධිපති උතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2022 අංක 77

DIVF/RECT/282/01/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට මේජර් නිලයෙහි නිළ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත:-

අ. කපිතන් (තාවකාලික මේජර්) හේරත් මුදියන්සේලාගේ පුෂ්පජිත මංජුල බණ්ඩාර ශ්‍රීලකාහ (නි/4972) - 2013.12.01

ආ. කපිතන් (තාවකාලික මේජර්) කෝරලේගෙයි සජිත් ප්‍රසාන්ත ශ්‍රීලවියාඉ (නි/5109) - 2013.12.01

ඇ. කපිතන් (තාවකාලික මේජර්) ජම්බුගහ ගෙදර ධම්මික ජයරත්න කුමාර ශ්‍රීලංජාආබමු (නි/5389) - 2013.12.01

ඈ. කපිතන් (තාවකාලික මේජර්) අතුරුගිරි ආරච්චිලාගේ නිරෝෂ භාරත අතුරුගිරි ශ්‍රීලපාහ (නි/5458) - 2013.12.01

ඉ. කපිතන් (තාවකාලික මේජර්) විල්ආරච්චිගේ දොන් මර්වින්ටනි ගුණතිලක ආර්එස්පී ශ්‍රීලංජාආබමු (නි/5459) - 2013.12.01

ඊ. කපිතන් (තාවකාලික මේජර්) රත්නායක මුදියන්සේලාගේ උදය සම්පත් ශ්‍රීලයුපුබ (නි/5476) - 2013.12.01

උ. කපිතන් (තාවකාලික මේජර්) අම්බලම් පිටිගේ තරිඳු සම්පත් අත්තනායක ශ්‍රීලංජාආබමු (නි/5494) - 2013.12.01

ඌ. කපිතන් (තාවකාලික මේජර්) කෝණාර මුදියන්සේලාගේ කොස්ගොල්ලේගෙදර රංජිත් කෝනාරසිංහ ශ්‍රීලංජාආබමු (නි/5497) - 2013.12.01

එ. කපිතන් (තාවකාලික මේජර්) බාදන මුදියන්සේලාගේ චිරංජීව වීරසේකර ශ්‍රීලංජාආබමු (නි/5495) - 2014.01.08

ඒ. කපිතන් (තාවකාලික මේජර්) කුමුදුදේව සෙනෙවිරත්න ශ්‍රීලසසබ (නි/5638) - 2014.01.08

ඔ. කපිතන් (තාවකාලික මේජර්) රාජපක්ෂ පතිරනගේ චමිල නිරෝෂන් පියතිස්ස ශ්‍රීලකාහ (නි/5642) - 2014.01.08

ඕ. කපිතන් (තාවකාලික මේජර්) දිඹුල්පිටියේගෙදර විජේකෝන් මුදියන්සේලාගේ ශාන්ත පියරත්න විජේකෝන් විපාරෙ (නි/5646) - 2014.01.08

ක. කපිතන් (තාවකාලික මේජර්) ගලහිටිය රාලලාගේ අනුර පුන්‍යසිරි ශ්‍රීලංසිරෙ (නි/5647) - 2014.01.08

ග. කපිතන් (තාවකාලික මේජර්) මරක්කලගේ නන්දන ක්‍රිෂාන් කුමාර ගරෙ (නි/5649) 2014.01.08

ච. කපිතන් (තාවකාලික මේජර්) හේරත් මුදියන්සේලාගේ කාලිංග මහානාම හේරත් ගරෙ (නි/5650) - 2014.01.08

ජ. කපිතන් (තාවකාලික මේජර්) ලියන්ගහමඩේ ගෙදර රෝහණ පුෂ්ප කුමාර විමලසේන සබුබ (නි/5655) - 2014.01.08.

ට. කපිතන් (තාවකාලික මේජර්) ගලගෙදර ශ්‍රීනාත් සුසන්ත ගලගෙදර ශ්‍රීලංජාආබමු (නි/5657) - 2014.01.08

ඩ. කපිතන් (තාවකාලික මේජර්) මිල්ලවාන රන්ගෙදර මැණික් බංඩාරගේ මානවසිංහ මිල්ලවාන ගරෙ (නි/5659) - 2014.01.08

ණ. කපිතන් (තාවකාලික මේජර්) මද්දුමාගේ සනත් ගුණසේකර ශ්‍රීලංසිරෙ (නි/5662) - 2014.01.08

ත. කපිතන් (තාවකාලික මේජර්) උඩුකුමාර මුල්ලගේ පාලින්ද උඩුකුමාර ශ්‍රීලපාහ (නි/5663) - 2014.01.08

ද. කපිතන් (තාවකාලික මේජර්) සංජීව ජයවර්ධන අමදෝරු ශ්‍රීලංජාආබමු (නි/5660) - 2014.01.08

න. කපිතන් (තාවකාලික මේජර්) වීරප්පුලිගේ රංජිත් ප්‍රසන්න ගරෙ (නි/5666) - 2014.01.08

ප. කපිතන් (තාවකාලික මේජර්) පෙමත්තු හේවගේ නිරෝෂන ගැහේබ (නි/5667) - 2014.01.08

බ. කපිතන් (තාවකාලික මේජර්) ගොඩේගෙයි ෂාමේන් ලෙනාඩ් තුෂාර ශ්‍රීලංජාආබමු (නි/5668) - 2014.01.08

ම. කපිතන් (තාවකාලික මේජර්) මීපිටිය විදානේලාගේ මංජුල උදයකුමාර ශ්‍රීලංසිරෙ (නි/5669) - 2014.01.08

ය. කපිතන් (තාවකාලික මේජර්) වන්නිආරච්චි කංකානමලාගේ චමින්ද වන්නිආරච්චි ශ්‍රීලංජාආබමු (නි/5671) - 2014.01.08

ර. කපිතන් (තාවකාලික මේජර්) වෙලගෙදර වර්ණකුලසූරිය ගරෙ (නි/5672) - 2014.01.08

ල. කපිතන් (තාවකාලික මේජර්) ගනේමුල්ලේ ලේකම්ලාගේ සුජිත් ආරියවංශ ශ්‍රීලංජාආබමු (නි/5673) - 2014.01.08

ව. කපිතන් (තාවකාලික මේජර්) විජේසේකර ගුණරත්න තෙන්නකෝන් වාසල අතපත්තු මුදියන්සේ රාළහාමිලාගේ ප්‍රසන්න සංජීව බෝයගොඩ ආර්එස්පී ශ්‍රීලංසිරෙ (නි/5674) - 2014.04.08

ස. කපිතන් (තාවකාලික මේජර්) චන්ද්‍ර අබේසිං විජේසේකර ශ්‍රීලංජාආබමු (නි/5676) - 2014.01.08

හ. කපිතන් (තාවකාලික මේජර්) මොරගහ මඩිත්තේ වලව්වේ යසලාල් ගීත කුමාර හාලියල ශ්‍රීලංජාආබමු (නි/5677) - 2014.01.08

ළ. කපිතන් (තාවකාලික මේජර්) සෙන්ද්‍රා හන්දි සුරංජිත් වාසනා පත්මජිත් ද සිල්වා ශ්‍රීලංජාආබමු (නි/5678) - 2014.01.08

අඅ. කපිතන් (තාවකාලික මේජර්) විටියල නිලුෂා සමංගිකා විදානගේ ශ්‍රීලයුකාබ (නි/5198) - 2013.06.20

අආ. කපිතන් (තාවකාලික මේජර්) කලුහත් ඩිසානි පුබුදු ද අබ්‍රේව් විජේසිංහ ශ්‍රීලයුකාබ (නි/5809) - 2013.08.09

අඇ. කපිතන් (තාවකාලික මේජර්) බුලත්වැල් කඳුරේ ගෙදර කුමුදුනී කුමාරි රත්නායක ශ්‍රීලයුකාබ (නි/5543) - 2014.01.08

අඈ. කපිතන් (තාවකාලික මේජර්) ලියන රාලලාගේ ටෙනිකා නිශානි ලියනගේ ශ්‍රීලයුකාබ (නි/5551) - 2014.01.08

ඉඉ. කපිතන් (තාවකාලික මේජර්) බැමින හැන්නැදිගේ ශ්‍රීමාලි ප්‍රනාන්දු ශ්‍රීලයුකාබ (නි/5553) - 2014.01.08

ඊඊ. කපිතන් (තාවකාලික මේජර්) නිලන්ති කෝරලගමගේ ශ්‍රීලයුකාබ (නි/5555) - 2014.01.08

උඋ. කපිතන් (තාවකාලික මේජර්) ජීවනා ප්‍රාසාදිනී ගල්ගමුව ශ්‍රීලයුකාබ (නි/5559) - 2014.01.08

උඑඑ. කපිතන් (තාවකාලික මේජර්) පල්ලියගුරුගේ දෝන චම්පිකා ප්‍රියන්ති ශ්‍රීලයුකාබ (නි/5525) - 2014.01.08

එඑ. කපිතන් (තාවකාලික මේජර්) මල්ලවආරච්චිගේ අමිලා තුෂාරි මල්ලවආරච්චි ශ්‍රීලයුකාබ (නි/5545) - 2014.01.08

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී. එම්. යූ. ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මාර්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

01-285

---

MOD/DEF/HRM/04/SLN/DIS/2021/(10).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද සේවය අත්හිටුවීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ නිල රාජකාරී කටයුතු 2021 දෙසැම්බර් මස 17 වැනි දින සිට අත්හිටුවීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත:-

කොමදෝරු (සැ) සම්පත් නිශාන්ත කුමාර පත්බේරිය, ආර්එස්පී, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0358

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-286/1

---

MOD/DEF/HRM/04/SLN/DIS/2021/(09).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

සිය නිල කටයුතු ඉටුකිරීමේ විෂයයෙහි අත්හිටුවනු ලැබීම

පහත නම සඳහන් නිලධාරියා 2021 නොවැම්බර් මස 16 වැනි දින සිට සිය නිල කටයුතු ඉටුකිරීමේ විෂයයෙහි අත්හිටුවනු ලැබේ:-

වැඩබලන ලුතිනන් උඩගේ කම්කානම්ගේ හර්ෂ මදුරංග උඩගේ, එන්ආර්එක්ස් 3890, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-286/2

---

2022 අංක 78

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් ආධුනික නිලධාරීන් දක්වා ඇති ජ්‍යෙෂ්ඨත්වය අනුව ජාතික ශිෂ්‍යභට බලකායේ අධිකාරියට පත් කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකර ඇත:-

*2020 දෙසැම්බර් මස 10 දින සිට දෙවන ලුතිනන් වශයෙන්,*

1. යටියාවල කන්දේ වලව්වේ බමුණු මුදියන්සේ රාලාමිලාගේ ලසන්ත චතුරංග ඒකනායක
2. සමරසිංහ ආරච්චිගේ උපාලි
3. වික්‍රම ආරච්චිලාගේ දසුන් වික්‍රම ආරච්චි
4. ජෙයපාලන් ජෝයි සංජීව්
5. හේරත් මුදියන්සේලාගේ හර්ෂන ගයාන් රත්නායක
6. වීරසිංහගේ රුවන් දුමින්ද වීරසිංහ
7. ඉපිට ලියන ගමගේ චතුර ජීවන් කුමාර
8. අසුරප්පුලි හේවාගේ සුරංග සඳකැලුම්
9. තලා බණ්ඩාරලාගේ මද්දුම බණ්ඩාර

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

01-260

# රජයේ නිවේදන

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/85/2021/පිටු/සැ.

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2022.01.28 වැනි දින සිට 2022.02.11 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2022.02.18 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

## උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 547 වෙළුමේ 216 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ, නාවල - කොස්වත්තේ පිහිටි 'දෙල්ගහවත්ත *හෙවත්* පැලවත්ත' නමැති ඉඩමේ වරිපනම් අංක 128/7 සඳහා මායිම්,<br><br>*උතුරට* : බටුගහගේ දොන් චාර්ල්ස්ට අයිති ඉඩම<br>*නැගෙනහිරට* : කුඹුර<br>*දකුණට* : ගුණවර්ධනට අයිති මෙම ඉඩමේ කොටස<br>*බස්නාහිරට* : ගුණවර්ධනට අයිති මෙම ඉඩමේ කොටස සහ දෙවට පාර<br><br>බිම් ප්‍රමාණය : අ.01 රූ.00 පර්.00 | 01. ඊ. ඩබ්. පී. වීරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1952.11.22 වැනි දින ලියා සහතික කරන ලද අංක 5047 දරන විකුණුම් ඔප්පුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 547 වෙළුමේ 217 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ, නාවල පිහිටි 'බකිණිගහ කුඹුර' නමැති ඉඩම සඳහා මායිම්,<br>*උතුර* : ලොකු දිගනේ කුඹුර<br>*නැගෙනහිර* : ජුවන්නවේ ඇළ<br>*දකුණ* : කජුගහ වෙලේ කුඹුර<br>*බස්නාහිර* : දවටගහ කුඹුර<br>බිම් ප්‍රමාණය : අ.06 රූ.00 පර්.00 | 01. ඊ. ඩබ්. පී. වීරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1952.11.22 වැනි දින ලියා සහතික කරන ලද අංක 5047 දරන විකුණුම් ඔප්පුව. |

01-244

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### මහජන බැංකුව - මහර (217)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.10.29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජී. එන්. ප්‍රගති විසින් සහතික කරන ලද 2019.11.27 දිනැති අංක 3277 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්,

කමල් ගීතදේව හෙට්ටිආරච්චි යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී උකස්කරය යටතේ රුපියල් දහතුන් මිලියන දෙලක්ෂ හයදාස් තුන්සිය හැත්තෑහතරයි ශත පනස් එක (රු. 13,206,374.51)ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2021.09.17 දින සිට වාර්ෂිකව 18% බැගින් රුපියල් එකළොස් මිලියන හත්ලක්ෂ අසූහත්දහස (රු. 11,787,000.00)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දහතුන් මිලියන දෙලක්ෂ හයදහස් තුන්සිය හැත්තෑහතරයි ශත පනස් එක (රු. 13,206,374.51)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂෝක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 3277 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාවට අයත් අංක 266, දකුණු තලවතුහේන්පිට ග්‍රාම නිලධාරි වසමේ, තලවතුහේන්පිට ග්‍රාමයේ පිහිටි වරිපනම් අංක 392 දරන "මිල්ලගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ඩබ්. ඩී. පෙරේරා මහතා විසින් 1996.06.23 දින සාදන ලද අංක 81/1996 දරන පිඹුරට අනුව ලොට් අංක 3B ද, සඳහා මායිම්, උතුරට : මාකොල පාර, නැගෙනහිරට : පාර, දකුණට : මාකොළ දකුණ පිහිටි වරිපනම් අංක 1/4 දරන පරිශ්‍රය, බටහිරට : ලොට අංක 3A යන මායිම් තුළ පිහිටි පර්චස් අටයි (අ.00, රූ.00, පර්.8)ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ඇතුළු සියලු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක G81/132හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කළ කොටස්වල මාර්ග අයිතියද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

01-245

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.12.15 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුකුලසූරියගේ සුදේශ් දිලුම් කුමාර ප්‍රනාන්දු සහ සිංහාර තරංගි මදුමාලි සිල්වා

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දිලුමිණි වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 2965 සහ 2017.10.11 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය, ඉහත කී කුරුකුලසූරියගේ සුදේශ් දිලුම් කුමාර ප්‍රනාන්දු සහ සිංහාර තරංගි මදුමාලි සිල්වා යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදායින් ලෙස ක්‍රියාකරමින් ඉහත කී කුරුකුලසූරියගේ සුදේශ් දිලුම් කුමාර ප්‍රනාන්දු සහ සිංහාර තරංගි මදුමාලි සිල්වා යන අය විසින් සහ උකස්කරු ලෙස ක්‍රියාකරමින් ඉහත කී සිංහාර තරංගි මදුමාලි සිල්වා යන අය විසින් කොළඹ 02, යුනියන් පෙදෙස, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් මත ආපසු ගෙවීම් ඉහත කී කුරුකුලසූරියගේ සුදේශ් දිලුම් කුමාර ප්‍රනාන්දු සහ සිංහාර තරංගි මදුමාලි සිල්වා යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව, කාලීන ණය පහසුකම් මත රුපයල් එක්කෝටි තුන්ලක්ෂ විසිහයදහස් පන්සිය හැත්තෑ එකකුත් ශත හතරක (රු. 10,326,571.04) මුදලක් සහ තව ද, එකී ණය පහසුකම් මත 2021.09.07 වැනි දිනට මුල් හිඟ මුදල වන රුපියල් එක්කෝටි තුන්ලක්ෂ දාසයදහස් දෙසියහැත්තෑපහකුත් ශත හැටහතක (රු. 10,316,275.67) මුදල මත එකඟ වූ පරිදි 2021.09.08 වැනි දින සිට එකඟ වූ පරිදි තවදුරටත් පොළිය ද, තව ද, ඒ හා සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වේතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන එම්. එච්. ටී. කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරනලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ (පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 596 දරන පින්වත්ත ග්‍රාමනිලධාර වසමේ) පින්වත්ත ගමේ පිහිටි කඳුරුගහවත්ත, වෙළබොඩවත්තේ වෙළබොඩවත්ත කොටසක් සහ යාබද පාවුල ඕවිට, දෙල්ගහවත්තපාවුලඕවිටේ කොටසක්, දෙල්ගහවත්තපාවුල ගලවිලදෙණිය ඕවිටේ කොටසක් සහ ගලවිලදෙණියේ කොටසක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් මැන සාදන ලද අංක 10268 සහ 2015.10.10 දින දරන පිඹුරේ නිරූපිත ලොට් M වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 5A1 ද, නැගෙනහිරට : පින්වත්ත පිරිවෙණ පාරේ සිට වැටී ඇති පාර (පිටවුම) ද, දකුණට : පාර (පිටවුම) සහ අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 5E හි කොටසක් ද, බස්නාහිරට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 5D ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 10268 දරන පිඹුර අනුව පර්චස් දාහතරයි දශම හතයි බින්දුවක් (අ.0, රූ.0, පර්.14.70) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමඟය.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 203/113 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම වනාහි මෙහි පහත සවිස්තරව දැක්වෙන ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් වේ.

1. ඉහත කී පින්වත්ත ගමේ පිහිටි කදුරුගහවත්ත, වෙළබොඩවත්තේ, වෙරළබොඩවත්ත කොටසක් සහ යාබද පාවුල ඕවිට, දෙල්ගහවත්තපාවුලඕවිටේ කොටසක්, දෙල්ගහවත්තපාවුල ගලවිලදෙණිය ඕවිටේ කොටසක් සහ ගලවිලදෙණියේ කොටසක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් මැන සාදන ලද අංක 3795 සහ 2004.02.01 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 5A1 ද, නැගෙනහිරට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 ද, දකුණට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 5E ද, බස්නාහිරට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 5D ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3795 දරන පිඹුර අනුව පර්චස් හයයි දශම නවයයි බින්දුවක් (අ.0, රූ.0- පර් 6.90) විශාල ඉඩම් කැබැල්ලය.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 203/75 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී පින්වත්ත ගමේ පිහිටි කදුරුගහවත්ත, වෙළබොඩවත්තේ, වෙළබොඩවත්ත කොටසක් සහ යාබද පාවුල ඕවිට, දෙලගහවත්තපාවුලඕවිටේ කොටසක්, දෙල්ගහවත්තපාවුල ගලවිලදෙණිය ඕවිටේ කොටසක් සහ ගලවිලදෙණියේ කොටසක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් මැන සාදන ලද අංක 3795 සහ 2004.02.01 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 5A1 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංක 3795 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 (පාර) ද, බස්නාහිරට : අංක 3795 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3795 දරන පිඹුර අනුව පර්චස් හයයි දශම අටයි බින්දුවක් (පර් 6.80) විශාල ඉඩම් කැබැල්ලය.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 203/71 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී පින්වත්ත ගමේ පිහිටි කදුරුගහවත්ත, වෙළබොඩවත්තේ, වෙළබොඩවත්ත කොටසක් සහ යාබද පාවුල ඕවිට, දෙලගහවත්තපාවුලඕවිටේ කොටසක්, දෙල්ගහවත්තපාවුල ගලවිලදෙණිය ඕවිටේ කොටසක් සහ ගලවිලදෙණියේ කොටසක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අර්. ජයසේකර විසින් මැන සාදන ලද අංක 3795 සහ 2004.02.01 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 3 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ නිරූපිත ලොට් 2 ද, නැගෙනහිරට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 (අඩි 14ක් පළල පාර) ද, දකුණට : අංක 5560 දරන පිඹුරේ නිරූපිත ලොට් 5E ද, බස්නාහිරට : මෙම පිඹුරේම නිරූපිත ලොට් 1 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3795 දරන පිඹුර අනුව පර්චස් එකක් (පර්. 1) විශාල ඉඩම් කැබැල්ලය.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 203/72 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

තේජා සිල්වා,
සමූහ සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස.
කොළඹ 02.

01-297

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.